# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය - 2023**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක ඉංග්‍රීසි/දෙමළ තනතුරු 04ක සහ ඉංග්‍රීසි/සිංහල තනතුරු 02ක පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2023 ජූලි මස කොළඹ දී** පැවැත් වේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය හැකිය.

(අ.) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2023 මැයි මස 08** වේ.

**සටහන :** අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

01. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

iii. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක සේවය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති හා සිදු කරනු ලබන්නා වූ සංශෝධනවල ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

iv. ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

02. *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක EST 5/4/24(XIX)-9 හා 2018.02.21 දිනැති ලිපිය මගින් අනුමත කළ නව වැටුප් ව්‍යුහය අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 75,000 - 10x1630 - 91,300 සහ වැටුප් කේතය LDS1-2016 වේ.

03. *සුදුසුකම් :*

3.1 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම
ii. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ භාෂාවට සහ ඉංග්‍රීසි භාෂාවට විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම.

3.2 පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර එක (01) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා සහතික කරන්නාගේ නිලමුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.)

3.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

3.4 වෙනත් සුදුසුකම් :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට, එනම් 2023 මැයි මස 08 වැනි දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
iv. අයදුම්කරුවන් ශ්‍රී ලංකා නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවකු වී නොතිබිය යුතුය.

04. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි වීම.

05. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත තරග විභාගයක හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. විභාගයේදී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරෙහි පුරප්පාඩු ගණන මෙන් පස්ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අංක 07 යටතේ ඉදිරිපත් කර ඇති ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබේ. ලිඛිත විභාගයේ ලකුණු හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එක් එක් තනතුරට පත් කරනු ලැබේ. පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

06. *විභාග පටිපාටිය* :

පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02)කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. අපේක්ෂකයින් සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු ය. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන්ට තමන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* | *සාමර්ථ්‍යය සඳහා අවශ්‍ය අවම ලකුණු* |
|---|---|---|
| 1. නීතිය පිළිබඳ දැනීම (කාලය පැය 02) | i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනීම.<br>ii. අර්ථ නිරූපණ ආඥාපනතෙහි විධිවිධාන ඇතුළු ව්‍යවස්ථා අර්ථ නිරූපණය පිළිබඳ නෛතික මූලධර්ම<br>iii. සාමාන්‍ය නීති මූලධර්ම | 40% |
| 2. භාෂා නිපුණතාව (කාලය පැය 01)<br><br>i. පරිවර්තනය | ඉංග්‍රීසි භාෂාවෙන් ඇති පාර්ලිමේන්තු පනතක කොටසක් සිංහල/දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම<br><br>ඉංග්‍රීසි භාෂාවෙන් වූ පනතක වගන්තියක් එහි සදොස් සිංහල/දෙමළ පරිවර්තනයක් ද සමග සසඳා සිංහල/දෙමළ පරිවර්තනය නිවැරදි ලෙස ප්‍රතිශෝධනය කිරීම හා | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය | සාමර්ථ්‍යය සඳහා අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|
| ii. ව්‍යාකරණ | සිංහල/දෙමළ හා ඉංග්‍රීසි ව්‍යාකරණ පිළිබඳ දැනීම විමසන ප්‍රශ්න පත්‍රවලින් අදාළ භාෂා දෙකක (ඉංග්‍රීසි සහ සිංහල හෝ ඉංග්‍රීසි සහ දෙමළ) ප්‍රශ්න පත්‍රයකට අපේක්ෂකයින් පෙනී සිටිය යුතුය. | |

07. *යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය*

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ එක් එක් විෂයයට 40%ට වඩා ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස්ගුණයක අපේක්ෂකයින් සංඛ්‍යාවක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ලකුණු දීමේ පටිපාටිය

| අනු අංකය | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* | | |
| | අ.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | ආ.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් ඇටර්නි ඩිප්ලෝමාවක් | 20 | |
| | ඇ.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද, | | 25 |
| | ■ පළමු පන්තියේ සාමර්ථ්‍යය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | ■ දෙවන පන්තියේ ඉහළ සාමර්ථ්‍යය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | ■ දෙවන පන්තියේ පහළ සාමර්ථ්‍යය සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | ■ සාමාන්‍ය සාමර්ථ්‍යය සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | ඈ.) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථ්‍යය | 10 | |
| | ඉ.) නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථ්‍යය | 05 | |
| | **සටහන** I : ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| 02. | *භාෂා ප්‍රවීණතාව* | | |
| | 01. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | | |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධිය | 05 | 10 |

| අනු අංකය | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| | ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ රජයේ පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF3/NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමර්ථ්‍යයක් ලබා තිබීම හෝ IELTS (Academic) සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම<br><br>02. සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාව<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිංහල/දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධිය<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පුහුණු ආයතනයක සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (අවුරුදු 01කට නොඅඩු)<br><br>**සටහන :** එක් උපශීර්ෂයක් යටතේ ඉහළ ම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ඇත. | 04<br><br><br><br><br>05<br><br>04 | |
| 03. | *අතිරේක පළපුරුද්ද*<br><br>තනතුරට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 01ක සේවා කාලයට අමතරව නීතිඥවරයකු/නීති තනතුරක් දරන්නකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 02 බැගින් උපරිමය ලකුණු 10ක්<br><br>**සටහන I :** පෞද්ගලික නීති සේවයේ යෙදෙන අයදුම්කරුවන් අවුරුදු විස්සකට (20) නොඅඩු නීතිඥ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයකුගෙන් හෝ අධිකරණ සේවා නිලධරයකු වෙතින් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය. රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක නීති තනතුරක් දරන අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධාන වෙතින් ලබාගත් සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>**සටහන II :** සේවය ආරම්භ වන හා අවසාන වන දින නිශ්චිතව සඳහන් නොවන සේවා සහතික ලකුණු ලබා දීම සඳහා පිළිගනු නොලැබේ. | | 10 |
| 04. | යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | 05 |
| | මුළු එකතුව | | 50 |

08. *ඉල්ලුම් කිරීමේ පිළිවෙළ*

ආදර්ශ අයදුම්පත :

8.1 මෙම නිවේදනය අවසානයේ පළකර ඇති ආදර්ශ අයදුම්පත ආකාරයට අයදුම්කරුවන් විසින් තම අයදුම්පත විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන්ම පිළියෙල කළ යුතු අතර, එය තමන්ගේම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක් ම උපදෙස් දී ඇති පරිදි ම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේ ම සිහි තබා ගත යුතුය. අයදුම්පත් සෙ.මී. 21x29.7 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් සකස් කළ යුතු අතර,

(අ.) අංක 1 සිට 6 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද
(ආ.) අංක 7 සිට 12 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද
(ඇ.) අංක 13 සිට 14 ශීර්ෂ තෙවන පිටුවට සහ ඉතිරිය හතරවන පිටුවට ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කළ යුතු අතර නියමිත ලෙස සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8.2 තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත මෙම විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, ආදර්ශ අයදුම්පත අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි.

අයදුම්පත් ඉදිරිපත් කිරීම :

8.3 පිළියෙල කරන ලද අයදුම්පත් **2023 මැයි 08 දිනට හෝ** ඊට පෙර "විභාග කොමසාරිස්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය - 2023" ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද විභාගයේ නම, සිංහල/දෙමළ අයදුම්පත්වල සිංහල/දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

8.4 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් ලද බව නොදන්වන අතර අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවා ඇති අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විභාග ගාස්තු :

8.5 විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ අදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

8.6 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

09. විභාග ප්‍රවේශ පත්‍ර

9.1 නිවේදනයෙ හි සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත.

9.2 නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයකු වේ නම් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ඉහත විස්තර සමඟ, ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් එලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබා ගත් සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙ හි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම වඩාත් එලදායී වනු ඇත.

9.3 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

විභාග ප්‍රවේශ පත්‍රය සහතික කරගැනීම

9.4 විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා

ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/ විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

විභාගයට ඇතුළත්කර ගැනීම :

9.5 නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය, විභාගයට පෙනී සිටින පළමු දිනයේ දීම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අපේක්ෂකයකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත.

9.6 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

සැලකිය යුතුය :

(අ.) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ.) සම්මුඛ පරීක්ෂණයේදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම:

11.1 යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කෙරේ.

11.2 අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

12. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

13. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

14. මෙහි සඳහන් පුරප්පාඩු අතුරින් කොටසක් හෝ සියල්ල නොපුරවා තැබීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි,

වසන්තා පෙරේරා,
ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
සංඝරාජ මාවත,
කොළඹ 10

2023 අප්‍රේල් මස 06 වන දින